GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012.06.16

## පුවත්පත් නිවේදනයයි

### ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට නිලධාරියෙකු පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම නිසා අහිමි වී ඇති ගැටළුකාරී තත්ත්වය

1999.12.15 දින එවකට සිටි අතිගරු ජනාධිපතිනිය විසින් නිකුත් කර ඇති අංක 1110/10 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙන් වෛද්‍ය සේවාව (විශේෂඥ, විශේෂඥ නොවන සහ වෛද්‍ය පරිපාලන වෛද්‍ය නිලධාරී සේවා) දිපව්‍යාප්ත සේවාවක් බවට ප්‍රකාශයට පත්කර ඇත.

1991.05.17 දිනැති අංක 662/11 දරන සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය පිරිස් පිළිබඳ ව්‍යවස්ථාව පිළිබඳ ගැසට් නිවේදන සහ පසු ඇමුණුම්වලට අනුව සහ 2003.07.02 දිනැති අංක 1295/26 දරන අති විශේෂ ගැසට් නිවේදනය, 2009.02.20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් නිවේදනයන්ට අනුව වෛද්‍ය නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරුකිරීම හා විනය පිළිබඳ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සහ බලය අභිනියෝජිත නිලධාරියා ලෙස රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ලේකම් වෙත පැවරෙන බව පැහැදිලිව සඳහන් වේ.

2007.04.16 දිනැති අංක 1493/3 දරන, සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය පිරිස් පිළිබඳ ව්‍යවස්ථාවට අදාල අතිවිශේෂ ගැසට් නිවේදනයේ 9.2 ඡේදයේ (4A පිටුවේ) සටහන යටතේ III වගන්තියේ සඳහන් වන්නේ පුරප්පාඩු තනතුරු ප්‍රසිද්ධ කිරීමට ආණ්ඩුකාර අනුමැතියක් ලබා ගැනීමක් පමණි.

**ඒ අනුව තාවකාලිකව හෝ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීමට පළාත් සෞඛ්‍ය ලේකම්ට බලයක් පවරා නැති අතර අයිතියක් ද නැත.** වසර මැද පුරප්පාඩුවක් ඇති වුවහොත් ඊලගට සිටින ජ්‍යේෂ්ඨ නිලධාරියාව වැඩ බැලීමට පත් කිරීමේ බලය රේඛීය අමාත්‍යාංශ සෞඛ්‍ය ලේකම් වෙත පවරා ඇති අතර එම පුරප්පාඩුව පිරවීමේ ක්‍රියා පිටිපාටිය 2007.04.16 දිනැති අංක 1493/3 දරන, ගැසට් නිවේදනයේ පැහැදිලිව දක්වා ඇත.

මේ සියළු කරුණු නොසලකා හරිමින් ඌව පළාත් සෞඛ්‍ය ලේකම් වරයා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කිරීමට අයදුම්පත් කැඳවා ඇත.

මෙම නිවැරදි පටිපාටිය උල්ලංඝනය කරමින් පළාත් සභාව මගින් පත්කරණු ලබන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයෙකු යටතේ සේවය කිරීමට වෛද්‍ය නිලධාරීන් සුදානම් නැති බවත් එසේ යම්කිසි පුද්ගලයකු මේ තනතුරට පත් කලහොත් නැවත දැනුම් දීමකින් තොරව ඌව පළාත තුල වර්ජන ක්‍රියාදාමයකට යොමුවන බව දන්වනු කැමැත්තෙමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්